සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# භූගෝල විද්‍යාව

**06 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- දී ඇති උපදෙස් අනුව සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක 01 05 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

01 සබරගමු පළාතට කෑගල්ල හා ........................................................ දිස්ත්‍රික්ක අයත් වේ. (මොණරාගල / රත්නපුර / බදුල්ල)

02 වැඩිම දිස්ත්‍රික්ක ගණනක් අයත් වන්නේ .................................................. පළාතටය. (වයඹ, නැගෙනහිර, උතුරු)

03 පරිසරයේ පවතින ..................................... කාලගුණික අංගයක් වේ. (උස / සුළං / කඳු)

04 අධික සූර්යතාපයක් හා උෂ්ණත්වයක් පවතින විට ........................................ කාලගුණික තත්ත්වයක් ඇතිවේ. (සිසිල් / විවිධ / වියළි)

05 ජලවාෂ්ප ඉහළ නැග ................................................ වී ඝනීභවනය වී වර්ෂාව ලැබේ. (උණුසුම් / ඝන / සිසිල්)

- අංක 06 10 දක්වා වූ ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.

06 සුළඟේ වේගය මැනීමට සුළං දිශා දර්ශකය භාවිතා කරයි. ( )

07 සුදු රෙදි හොරා සංචාරක පක්ෂියෙකි. ( )

08 ආහාර හා ඖෂධ ලබාදීම මෙන්ම වායුගෝලය පිරිසිදු කිරීම ද ශාකවල කාර්යයකි. ( )

09 ගිරවා ගස්වල බීජ ව්‍යාප්තියට උදව් වන සතෙකි. ( )

10 වෙස් මුහුණු කර්මාන්තයට අම්බලන්ගොඩ ප්‍රසිද්ධ වේ. ( )

- අංක 11 15 දක්වා වූ ප්‍රශ්නවල හිස්තැනට නිවැරදි පිළිතුර ලියා දක්වන්න.

11 මිනිස් අවශ්‍යතා යම් ආයතනයක් මගින් ඉටුකරනු ලබන්නේ නම් එය ............................. වේ.

12 භූමිය විධිමත්ව පරිහරණය සඳහා ....................................... වලින් වැස්මක් යෙදීම වඩා ඵලදායී විය හැකිය.

13 බලශක්ති අවශ්‍යතා සඳහා වැදගත් විකල්ප ශක්තියක් ලෙස ................................ හැඳින්විය හැකිය.

14 ජීව වායු ඒකකයක් සෑදීමට ..................................................... වැනි ශාක භාවිතා කළ හැකිය.

15 විදුලිය අරපිරිමැස්මෙන් භාවිතය සඳහා ......................................................... විදුලි පහන් භාවිතය සුදුසු ය.

● අංක 16 20 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු හතරින් තෝරා යටින් ඉරක් අඳින්න.

16 සීමිත ඉඩකඩ ඇති නාගරික පරිසරයක අපද්‍රව්‍ය බැහැර කිරීම ගැටළු ඇතිකරන්නේ මින් කවර කරුණක් නිසාද?

(1) දිරාපත් නොවන අපද්‍රව්‍ය නිසා (2) ක්‍රමානුකූලව ඉවත් නොකිරීම නිසා

(3) ප්‍රතිචක්‍රීකරණය නොකිරීම නිසා (4) නැවත භාවිතයට නොගන්නා නිසා

17 ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම පිළිබඳව නිවැරදි ප්‍රකාශය මින් කුමක් ද?

(1) ශ්‍රී ලංකාවට උතුරින් ඉන්දියාව පිහිටීම.

(2) ශ්‍රී ලංකාව ලොව විශාලම මහාද්වීපයට අයිති වීම.

(3) අප්‍රිකා මහාද්වීපයට නැගෙනහිරින් ශ්‍රී ලංකාව පිහිටීම.

(4) ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පෝක් සමුද්‍ර සන්ධිය පිහිටීම.

18 ශ්‍රී ලංකාවේ සංස්කෘතික වශයෙන් වැදගත් ස්ථානය මින් කුමක් ද?

(1) නුවර එළිය (2) ශ්‍රී ජයවර්ධන පුර කෝට්ටේ

(3) කොට්ටාව (4) ත්‍රිකුණාමලය

19 මේවායින් ආසියා මහාද්වීපයට අයිති දූපත වන්නේ කුමක් ද?

(1) තායිවානය (2) මැඩගස්කරය

(3) සිසිලිය (4) කියුබාව

20 ශ්‍රී ලංකාවට වසර පුරාම වැසි ලැබීම කෙරෙහි බලපා ඇති කරුණ මින් කුමක් ද?

(1) මෝසම් සුළං බලපෑම (2) උෂ්ණත්වය අධික වීම

(3) දූපතක් ලෙස පිහිටීම (4) වියළි හා තෙත් සුළංවල බලපෑම


(2 x 20 = 40)

e-තක්සලාව The National e-learning Portal for the General Education

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01 6 ශ්‍රේණියේ දී ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම පිළිබඳව කළ කණ්ඩායම් ක්‍රියාකාරකම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ඒ සඳහා පහත දැක්වෙන රූප සටහන උපයෝගී කර ගන්න.




(1) රටක සාපේක්ෂ පිහිටීම යනු කුමක් ද? (ල. 02)

(2) ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම පිළිබඳව ඉහත රූප සටහනට අනුව වාක්‍ය 3 ක් ලියා දක්වන්න. (ල. 06)

(3) ශ්‍රී ලංකාව අයිතිවන මහාද්වීපය දක්වා එය ඉන්දියාවෙන් වෙන්වී ඇති සුමුද්‍ර සන්ධිය දක්වන්න. (ල. 02)

(4) ඉහත සිතියම අනුව ලංකාව හැර එහි දැක්වෙන වෙනත් දූපත් 2 ක් දක්වන්න. (ල. 02)

02 එදිනෙදා ජීවිතයේ දී විවිධ කාර්යයන් සඳහා අපි බලශක්තිය භාවිතා කරන්නෙමු.

(1) බලශක්තිය සඳහා යොදාගන්නා විවිධ බලශක්ති ප්‍රභවයන් 3 ක් නම් කරන්න. (ල. 03)

(2) වර්තමානයේ බලශක්ති ඉල්ලුම ඉහළයාමට හේතු 3 ක් ලියන්න. (ල. 03)

(3) නිවසේ දී අරපිරිමැස්මෙන් බලශක්ති පරිහරණය සඳහා සැලකිල්ලට ගත යුතු කරුණු 4 ක් දක්වන්න. (ල. 04)

(4) බලශක්තිය පරිහරණයේ දී එම බලශක්ති ප්‍රභව අපතේ යන අවස්ථා 2 ක් දක්වන්න. (ල. 02)


03 (1) කාලගුණය මැනීමට යොදාගන්නා උපකරණයක් රූප සටහනේ දැක්වේ. එය කුමන කාලගුණික අංගයක් මැනීමට යොදාගන්නේ ද? එය හඳුන්වන නම කුමක් ද? (ල. 04)




The National e-Learning Portal for The General Education

(2) වර්ෂාව ඇතිවන ආකාරය පිළිබඳව මෙම රූප සටහනෙහි දක්වේ. එහි 1, 2 හා 3 යන අවස්ථාවල සිදුවන ක්‍රියාවලීන් දක්වන්න. (ල. 03)

(3) එම රූප සටහන ඇසුරින් වර්ෂාව ඇතිවන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)




04 (1) පහත සඳහන් සතුන්ගෙන් ලැබෙන ප්‍රයෝජන එක බැගින් ලියන්න. (ල. 06)

| | | |
|---|---|---|
| වේයා | ගිරවා | බත්කූරා |
| කපුටා | වවුලා | ඇටිකුකුළා |

(2) ඔබේ නිවසේ ඇති ගෘහ භාණ්ඩ කීපයක් පහත දැක්වේ. ඒ සඳහා යොදාගෙන ඇති දැව වර්ගය දක්වන්න.

මේසය / අල්මාරිය / දොර (ල. 03)

(3) ශාකවලින් ලැබෙන ප්‍රයෝජන තුනක් දක්වන්න. (ල. 03)

05 (1) ශ්‍රී ලංකාවේ පිහිටි වැදගත් ස්ථාන හා ඒවායේ පවතින විශේෂත්වය ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න. (ල. 06)

| ස්ථානය | විශේෂ ලක්ෂණ |
|---|---|
| 1. ........................................................ | ප්‍රධාන පරිපාලන නගරය |
| ගාල්ල | 2. ........................................................ |
| නුවරඑළිය | 3. ........................................................ |
| 4. ........................................................ | කෝනේෂ්වරම් කෝවිල |
| 5. ........................................................ | ප්‍රධාන වාණිජ මධ්‍යස්ථානයකි |
| මහනුවර | 6. ........................................................ |

(2) ශ්‍රී ලංකාවේ පිහිටීම දේශගුණය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳව කරුණු 3 ක් දක්වන්න. (ල. 06)

06 (1) පහත දැක්වෙන්නේ අවිධිමත් භූමි පරිහරණය ආශ්‍රිත අවස්ථා කිහිපයකි. ඒවා විධිමත් කර ගැනීමට කළ හැකි කටයුතු එක බැගින් දක්වන්න. (ල. 06)

කඳු බෑවුම්වල වගා කිරීම / කෘෂි රසායන පොහොර භාවිතය / පස සෝදායාම

(2) ජල දූෂණය සිදුවන ක්‍රම තුනක් දක්වන්න. (ල. 03)

(3) ජලය තිරසාරව පවත්වා ගැනීම සඳහා ගතහැකි පියවර 3 ක් දක්වන්න. (ල. 03)